## ජාතික එළදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත එළදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය

**1. හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධානවලට අනුව ජාතික එළදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත එළදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කරනු ලැබේ.

**2. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්**

2.1 නිලධරයන්

2.1.1. ජාතික එළදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්

2.1.2. ජාතික එළදායිතා ලේකම් කාර්යාලය යටතේ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්

සටහන

සංවර්ධන නිලධාරී සේවය සඳහා අන්තර්ග්‍රහණය වීමට මනාපය පළකර ඇති නමුත් මෙතෙක් අන්තර්ග්‍රහණය නොකළ නිලධාරීන්ට ද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර දෙකක් (02) සේවය කරන ලද නිලධරයින් අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. එහෙත් ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ ලද කිසිඳු නිලධාරියෙකුට නැවත එම වර්ෂයේ අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයදුම් කළ නොහැකිය.

2.2.2. එකම සේවා ස්ථානයක වසර පහකට (05) වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

2.2.3. දිස්ත්‍රික්කය තුළ වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්/ දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කළ හැකි ය.

2.2.4. එකම සේවා ස්ථානයේ වසර 7ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිටතට අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

2.3 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

2.3.1. 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධාරියකු වෙනත් ස්ථානයකට මාරුවීම් ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම් ඉටුකිරීම සඳහා 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති, එම ස්ථානයේ **වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියා ඉන් පිටතට මාරු කළ හැකි ය.**

2.3.2. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ලැබී ඇති විට, ඒ අතුරින් වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

2.3.3. වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරුවීම් ලබාදීමේ ගැටලු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මඟින් එම කරුණු සලකා බලා නව ස්ථානමාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

2.4 සේවා කාලය ගණනය කිරීම.

2.4.1. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබන්නේ දෙසැම්බර් මස 31 වන දිනට ය. (උදා :- 2023 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2022.12.31 දිනට)

2.4.2. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය යටතේ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

2.4.3. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සේවය කළ කාලය ගණනය කිරීමේදී නිලධාරියකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

**3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

අංක 1914/8 හා 2015.05.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 200 සංශෝධනය අනුව, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ආයතනික විෂයය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරියෙක්.
II. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සැලසුම් විෂයය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරියෙක්.
III. සංවර්ධන නිලධාරී සේවයට අයත් නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම්කල නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධරයෙක්.

**4. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

4.1 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

I. ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ
II. ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ අතිරේක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු දරන නිලධාරියෙක්
III. ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරියෙක්

**5. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැලකිල්ලට ගන්නා වෙතත් පොදු කරුණු, ලෙස දක්වා ඒ යටතේ වන කරුණු පහත පරිදි දක්වන්න.**

5.1 විශේෂිත කරුණු

I. යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට එම නිලධරයාගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම අනුව පමණි. එසේම, එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. (අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධව පසුව සලකා බලනු නොලැබේ).

II. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානයට අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

III. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයා සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

IV. ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ. මෙම ආබාධිත පදනමින් බඳවාගත් නිලධාරීන් ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන විටදී මෙය අදාළ නොවේ.

V. නිලධාරියාට මෙන්ම ඔහුගේ පවුලේ අයටද ඇතිවිය හැකි අපහසුතාවයන් අවම කිරීමට හැකිවන සේ ස්ථාන මාරුවක් ලබා දීමට පහසු වීම පිණිස නිලධාරියෙකු දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීමක් ඉල්ලුම් කරන අවස්ථාවේදී ඔහු විසින් ස්ථාන මාරුව ඉල්ලා සිටින දිස්ත්‍රික්කයට අමතරව තවත් විකල්ප දිස්ත්‍රික්ක දෙකක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු ය.

VI. ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයෙකු එම මාරුවීම් ක්‍රියාත්මක වන දිනෙන් පසුව එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරුවීම් ප්‍රතිපත්තියට පටහැනි ය.

VII. ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතු ය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VIII. ස්ථාන මාරු සඳහා එවනු ලබන ඉල්ලුම්පත්‍රය මේ සමඟ ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, එය දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/ අංශ භාර මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සලකා බලනු ලබන්නේ ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පමණි.

5.2 වාර්ෂික ස්ථාන මාරුවලට යටත් නොවන නිලධාරීන්

I. අවුරුදු 53 ඉක්ම වූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු ය.

II. අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකළ යුතු ය.

5.3 වෘත්තීය සමිති සඳහා අනුග්‍රහය

5.3.1. කම්කරු කොමසාරිස් විසින් ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතු ය.

5.3.2. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන වෘත්තීය සංගමයේ නිලධරයන් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්, ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.6 උප වගන්තිය අනුව නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

## 6. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කාල සටහන

| | කාරණය | දිනය |
|---|---|---|
| 01. | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | ජුනි මස 01 දිනට පෙර |
| 02. | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජුනි මස 30 දිනට පෙර |
| 03. | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජුලි මස 31 දිනට පෙර |
| 04. | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | අගෝස්තු මස 15 දිනට පෙර |
| 05. | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | අගෝස්තු මස 31 දිනට පෙර |
| 06. | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 දිනට පෙර |
| 07. | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාරගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 දිනට පෙර |
| 08. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | ඔක්තෝම්බර් මස 15 දිනට පෙර |
| 09. | වාර්ෂික ස්ථාන මාරුවීම් අවසාන නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 දිනට පෙර |
| 10. | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම | ජනවාරි මස 01 |

ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු කාලසටහන අනුව ගැටීමක් ඇති නොවන පරිදි වාර්ෂිකව මෙහි සඳහන් දිනයන් සංශෝධනය කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 7. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම

7.1 වාර්ෂික ස්ථාන මාරු කිරීමක් පිළිබඳව බලය අභිනියෝජිත බලධරයා විසින් දෙන ලද නියෝගයකින් අතෘප්තියට පත් වූ කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර A අනුව පමණක් සියලුම අදාළ තහවුරු කිරීමේ ලියවිලිවල සහතික කළ පිටපත් ද සමඟ ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ යථායෝග්‍ය පරිදි අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ/ හෝ බලය අභිනියෝජිත බලධරයා මඟින් පමණක් වන්නේ ය.

7.3 එසේ වුවද, එකී අභියාචනයේ ප්‍රගමන පිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඍජුවම යොමු කිරීමට එම රජයේ නිලධරයාට හැකියාව ඇත්තේ ය.

7.4 වාර්ෂික ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම ස්ථාන මාරු කිරීමේ නියෝගය ප්‍රසිද්ධියට පත් කරන ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළ දී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

7.5 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාරදෙනු ලබන අභියාචනයට අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, අභියාචනය පිළිබඳ ස්වකීය නිරීක්ෂණ හා මෙහි දැක්වෙන ආකෘති පත්‍ර අංක A හා B සමඟ නිර්දේශ සහිත එම අභියාචනය නොවැම්බර් මස 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා හා බලය අභිනියෝජිත බලධරයා කටයුතු කළ යුතු වන්නේ ය.

7.6 එවැනි අභියාචනයක් ලැබී දින 15 ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරනු ලබන්නේ ය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි කම්කරු අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේ ය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේ ය.

<u>සටහන</u>

1) මෙම වාර්ෂික ස්ථාන මාරු, ඒකාබද්ධ සේවාවන්වල වාර්ෂික ස්ථාන මාරුවලට බාධාවක් නොවන පරිදි ක්‍රියාත්මක කළ යුතු ය.
2) අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු කාලසටහන, ඒකාබද්ධ සේවාවන්වල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය හා චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට අනුකූල විය යුතු ය.
3) අභ්‍යන්තර ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබන නිලධාරියෙකු ඒකාබද්ධ සේවාවන් යටතේ ස්ථාන මාරුවක් ලබාගන්නේ නම්, එම නිලධාරියා සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කළ යුතුය.
4) හැකි සෑම අවස්ථාවකදීම ඒකාබද්ධ සේවාවන්වල වාර්ෂික ස්ථාන මාරු නියෝග ප්‍රසිද්ධ කිරීමෙන් පසු අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

චම්පිකා ඩී. ධර්මසේන
අධ්‍යක්ෂ
ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

චම්පිකා ඩී. ධර්මසේන
අධ්‍යක්ෂ
ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය
10 වන මහල ... 2 වන අදියර

දිනය : 2023 . 02 . 27